# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

**ලියාපදිංචිය සඳහා අවශ්‍ය කොන්දේසි**

01. දැනටමත් විශ්වවිද්‍යාලය වෙත සැපයුම්/කොන්ත්‍රාත්/සේවා සැපයුම් සඳහා ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන්, නව වර්ෂය සඳහා යළි අයදුම් කළ යුතුය.

02. භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වසර දෙකකට වඩා වැඩි පළපුරුද්දක් හා වාහන අළුත්වැඩියා සඳහා වසර තුනකට වඩා වැඩි වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය.

03. අදාළ සංවිධාන සතුව, වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් තිබිය යුතු අතර, එම ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය.

04. අපේක්ෂිත සැපයුම්කරුවන් සීමිත වගකීම් සහිත සමාගමක් වෙතොත්, සමාගම සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

05. අපේක්ෂිත සැපයුම්කරුවන් සීමිත වගකීම් සහිත සමාගමක් නොවන වෙනත් සංවිධානයක් වෙතොත් අදාළ ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.

06. ලැයිස්තුගත කේත අංක **C4 සිට C9** සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත සිවිල් ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරීයේ (CIDA)/ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) වලංගු ලියාපදිංචිය සතුවිය යුතුය. රාජ්‍ය අංශයේ සංවිධානවලට මෙම කොන්දේසිය අදාළ නොවේ.

07. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට අදාළ CIDA/ ICTAD ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.

08. සැපයුම්/කොන්ත්‍රාත්/සේවා සඳහා පළපුරුද්ද සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි (කොන්ත්‍රාත් ප්‍රදානයන්, මිල දී ගැනිමේ ඇණවුම් වැනි) එක් එක් අයදුම්පත සමඟ වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

09. භාණ්ඩ හා සේවාවන් සැපයීමට පෙර අත්තිකාරමක් ලෙස මුලින් ගෙවීම් ඉල්ලා සිටින සැපයුම් කරුවන් ලියාපදිංචි කරනු නොලබන අතර, අවම වශයෙන් දින 30 ක ණය පහසුකම් කාලයක් ලබා දිමට එකඟ විය යුතුය.

10. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ වැට් බදු ලියාපදිංචි සහතිකය හෝ වැට් බදුවලින් නිදහස් කළ සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි සපුරා නොමැති අයදුම්පත් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.